පාර්ලිමේන්තුවේ ග්‍රන්ථාගාරය

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 21 දරන
# වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 මැයි මස 2 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1980 මැයි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 20 යි　　　　තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1980 අංක 21 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 මැයි මස 2 වන දින]

එල්. ඩී.—ඕ. 43/79.

**1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1980 අංක 21 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1971 අංක 35 දරන පනතෙහි 12අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. 1971 අංක 35 දරන වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනතෙහි 12 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 12අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"කළ යුතු ගෙවීම් සඳහා පොලිය ගෙවිය යුතු බව.

12අ. පහත සඳහන් අවස්ථාවල දී, එනම්—

(අ) ආණ්ඩුව විසින් අත්කර ගන්නා ලද හෝ ආණ්ඩුව වෙත සතු කර ගන්නා ලද යම් වෙළෙඳ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ; හෝ

(ආ) යම් ව්‍යාපාරයක් සඳහා ආණ්ඩුව වෙත සතු කර ගනු ලැබූ හෝ බුත්තිය පවරා ගනු ලැබූ යම් දේපළක් සම්බන්ධයෙන්,

කළ යුතු ගෙවීම්, අවස්ථාවෝචිත පරිදි, ඒ වෙළෙඳ ව්‍යාපාරය හෝ දේපළ ආණ්ඩුව වෙත පවරා ගනු ලැබූ, සතු කරනු ලැබූ හෝ ආණ්ඩුව විසින් එහි බුත්තිය පවරා ගනු ලැබූ දිනයේ සිට උපචිත වූ ලෙස සැලකිය යුතු ය. එවැනි සෑම ගෙවීමක් වෙනුවෙන් එසේ උපචිත වූ දින සිට ඒ ගෙවීම කරන දිනය දක්වා කාලයට, නියමිත අනුපාතය අනුව වූ පොලියක් ගෙවිය යුතු ය.".

සංශෝධනය අතීතයට බලපාන බව.

3. මේ පනතේ 2 වන වගන්තිය මගින්, වෙළෙඳ ව්‍යාපාර (අත්කර ගැනීමේ) පනතට කරන ලද සංශෝධනය, ඒ පනත ක්‍රියාත්මක වූ දින සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය, රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.